THEEKSHANA

Global Universal Acceptance Day 2024

ICANN

## ගෝලීය විශ්ව සම්මුති දිනය මාර්තු 28 වන දින තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය ගරු කනක හේරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙයි.

විශ්ව සම්මුති (UA) දිනය 2024 මාර්තු 28 වන දින සවස 5:30 සිට 7:30 දක්වා ගෝල්ෆේස් හෝටලයේ දී පැවැත්වෙයි. එහි ගෝලීය උත්සවය ICANN (Internet Corporation for Assigned Names and Numbers) ආයතනය මගින් සංවිධානය කෙරෙන අතර දේශීය උත්සවය සංවිධානය කරනු ලබන්නේ තීක්ෂණ R&D ආයතනය මගිනි.

මෙම උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය ගරු කනක හේරත් මැතිතුමා ද ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ධර්මශ්‍රී කුමාරතුංග මහතා ද සහභාගී වන අතර ICANN ආයතනයෙහි දකුණු ආසියානු කලාපයෙහි පරිපාලන උපසභාපති සමීරන් ගුප්තා මහතා සහ ICANNහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකු ද සහභාගී වනු ඇත.

විශ්ව සම්මුති දිනය යනු UASG, ICANN සහ අදාළ කටයුතු වෙනුවෙන් උනන්දුවක් දක්වන ගෝලීය හවුල්කරුවන් සහ සංවිධාන මගින් සත්කාරකත්වය සපයනු ලබන,විශ්ව සම්මුති පිළිබඳ දැනුවත් කිරීම් මෙන්ම අධ්‍යයන සහ තාක්ෂණික පුහුණු සැසි ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් ගෝලීය ක්‍රියාවලියකි. 2023 වසරේ දී, රටවල්/ප්‍රදේශ 40කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන පුද්ගලයින් 9,400කට අධික සංඛ්‍යාවක් සහභාගී වෙමින් 50කට අධික ගෝලීය උත්සව අවස්ථා ඇතුළත් ව පවත්වන ලද ප්‍රාරම්භක විශ්ව සම්මුති දිනයෙහි සාර්ථකත්වය මත පදනම් ව, 2024 විශ්ව සම්මුති දිනය රටවල්/ප්‍රදේශ 57ක පැවැත්වීමෙහි අරමුණ වන්නේ විශ්ව සම්මුති සම්බන්ධයෙන් දේශීය, කලාපීය සහ ගෝලීය පාර්ශ්වකරුවන් දිරිගැන්වීමයි. මෙහි ප්‍රධාන උත්සවය සර්බියාවේ බෙල්ග්‍රේඩ්හි දී පැවැත්වෙනු ඇත.

විශ්ව සම්මුති යන්නෙන් අදහස් කරන්නේ භාෂාව හෝ අක්ෂර නො සලකා සියලු ම අන්තර්ජාල භාවිත කරන්නන්ට මාර්ගගත සම්පත් වෙත බාධාවකින් තොර ව පිවිසිය හැකි බව සහතික කිරීමේ ක්‍රමවේදයයි. ශ්‍රී ලාංකික පරිශීලකයින් සඳහා සිංහල සහ දෙමළ වැනි දේශීය භාෂාවලින් වසම් නාම සහ විද්‍යුත් තැපැල් ලිපිනයන් ලබා දීමෙන්, පුද්ගලයින්ට ඔවුන් කැමති භාෂාවෙන් අන්තර්ජාලය සැරිසැරීමේ හැකියාව ලබා දීම ICANN හි අභිප්‍රායයි. මෙම කටයුත්ත අන්තර්ජාලය සඳහා පිවිසීම ඉහළ දමනවා පමණක් නො ව, අන්තර්ජාලය තුළ විවිධත්වය මෙන්ම අන්තර්ගතය ද පෝෂණය කරයි. ජාත්‍යන්තර වසම් නාම සඳහා ICANNහි දිරිගැන්වීම සහ පහසුකම් සැපයීම මෙම ප්‍රයත්නයේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. දළ වශයෙන් බිලියන 6ක ජනතාවක් දැනට අන්තර්ජාලය භාවිත කරන අතර, භාෂා බාධකය බිඳ දැමීමෙන් තවත් බිලියන සංඛ්‍යාත පරිශීලකයින්ට ඒ සඳහා දොර විවර වන අතර එමඟින් ගෝලීය වශයෙන් අන්තර්ජාල ප්‍රවේශය පුළුල් වේ. ICANNහි දැක්ම වන්නේ තව දුරටත් ලතින් අක්ෂර ආධිපත්‍යය නො ලබන බහුභාෂා අන්තර්ජාලයක් නිර්මාණය කිරීමෙන් වඩාත් පුළුල් ඩිජිටල් භූ-දර්ශනයක් සඳහා මග පෑදීමයි.